

උඟ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	23	S	I	දේශපාලන විද්‍යාව / Political Science	I / I	කාලය : පැය දෙකයි / Time : Two hours

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේමසැපයිය යුතු වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණ 100 කි.

A කොටස

- අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. දේශපාලනය,
   (1) සමාජ ජීවිතයේ අත්‍යාවශ්‍ය හා අනිවාර්යය අංගය වේ.
   (2) පුරවැසියන් සම්බන්ධ නොවන ක්‍රියාවලියක් වේ.
   (3) රෝම යුගය තුළ වඩා වර්ධනය විය.
   (4) න්‍යායාත්මක සංකල්පයක් වන අතර ශාස්ත්‍රීය ලෙස හදාරයි.
   (5) ඇරිස්ටෝටල්, ප්ලේටෝ මෙහි පුරෝගාමීන් වේ. (.....)

02. දාර්ශනික අධ්‍යයන ප්‍රවේශය,
   (1) අධ්‍යයනයට ලක් කරන්නේ බෙහෙවින් නම්‍යශීලී විෂය කාරණා වේ.
   (2) ඇමරිකාවේ විශ්ව විද්‍යාලවල 1960 දශකයෙන් පසුව ආරම්භ වී ඇත.
   (3) ප්‍රතිමාණිය දෘෂ්ඨී කෝණය පිළිබඳව දැඩි උනන්දුවක් දක්වයි.
   (4) ආනුභවික පර්යේෂණ මත නිගමනවලට පැමිණේ.
   (5) මෙය දේශපාලන වශයෙන් ගතානුගතික වේ. (.....)

03. දේශපාලන න්‍යාය,
   (1) න්‍යායන් ගොඩනැඟීම ස්වභාවික විද්‍යාවන් වල පමණක් සිදු කෙරේ.
   (2) ප්‍රතිමාණිය න්‍යාය දේශපාලන දර්ශනයන් චින්තනයන් සමඟ අනන්‍ය වී ඇත.
   (3) සෛද්ධාන්තික මූලධර්ම විද්‍යාත්මක න්‍යායන් වල දක්නට ලැබේ.
   (4) ග්‍රීක යුගයෙන් පසු අවසන් විය.
   (5) ශාස්ත්‍රීය හැදෑරීමේ දී එතරම් අදාළ නොවේ (.....)

04. ඒකීය ආණ්ඩු ක්‍රමය,
   (1) සම්මුතියක් හෝ ගිවිසුමක් පදනම් කරගෙන බිහිවේ.
   (2) සමාජීය බෙදීම් වලට හා විවිධත්වයට ආයතනික පිළිතුරක් සපයයි.
   (3) අසංකීර්ණ හා කාර්යක්ෂම වේ.
   (4) ද්විමාණ්ඩලිකවාදය මත පදනම් වේ.
   (5) ද්විපක්ෂ ක්‍රමයක් පැවතීම මෙහි සාර්ථකත්වයට හේතු වේ. (.....)

05. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය,

(1) ව්‍යවස්ථාදායකයෙන් පරිබාහිර සාමාජිකයන් කැබිනට් මණ්ඩලයට පත් කළ හැකිවේ.

(2) ආණ්ඩුවේ සාමූහික වගකීම අපේක්ෂා කළ නොහැක.

(3) ආණ්ඩුවේ නායකයාට නාමික බලතල හිමි වේ.

(4) ව්‍යවස්ථාදායක හා විධායකය අතර පැහැදිලි බෙදීමක් නිර්මාණය කරයි.

(5) සත්‍ය විධායකය පාලනයේ නාභිය බවට පත් වේ. (.....)

06. ෆැටුම් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය,

(1) එකිනෙකට නොපෑහෙන අරමුණු පදනම් කරගෙන නිර්මාණය වේ.

(2) පුද්ගලයන් සහ සමාජීය වෙනස්වීම් වලට දායක නොවේ.

(3) සෑම විටම විනාශකාරී ප්‍රතිඵල අත්කර දේ.

(4) ෆැටුම් සමතනයට හොඳම විසඳුම යුද්ධය වේ.

(5) ෆැටුම් වැළැක්වීමට මූලහේතු සෙවීම අවශ්‍ය නොවේ. (.....)

07. ජාත්‍යන්තර දේශපාලනය,

(1) මෙහි හැඩය තීරණය කිරීම සඳහා බහුජාතික සංගම් වල ක්‍රියාකාරිත්වය පමණක් ප්‍රමාණවත් වේ.

(2) බ්‍රෙට්න්වුඩ්ස් සංවිධාන ජාලය රාජ්‍ය ක්‍රියාධරයන් ගණයට අයත් වේ.

(3) වර්තමාන ප්‍රවණතාවය වන්නේ ද්විධ්‍රැවීය ලෝක ක්‍රමයක් නිර්මාණය වේ.

(4) දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම් මෙහි ප්‍රමුඛ ක්‍රියාධරයෝ වේ.

(5) රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ජාතික බලය තීරණය කිරීමට යොදා නොගනී. (.....)

08. රාජ්‍ය ප්‍රතිපත්ති,

(1) රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනයට දීර්ඝ ඉතිහාසයක් තිබේ.

(2) ජනතාවගේ දුක් ගැනවිලි වලට විසඳුම් ලබා දෙන ක්‍රියාවලියක් නොවේ.

(3) ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම යනු පනත් කෙටුම්පතක් නීතියක් බවට පත් වීමෙන් පසු සිදුවන දේ වේ.

(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් විධායකය නිසි බලධාරී ආයතනක් නොවේ.

(5) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ දී දේශපාලන පක්ෂ වැදගත් කාර්යභාරයක් ඉටු නොකරයි.

(.....)

09. ව්‍යවස්ථානුකූලවාදය,

(1) පීඩාකාරී පාලනයක් ඇති වීමට තිබෙන හැකියාව වැඩි වේ.

(2) ලිබරල්වාදයේ දේශපාලන වටිනාකම් අතුරෙන් එකකි.

(3) ආණ්ඩු බලය ඒකරාශි වීමට අනුබල සපයයි.

(4) රාජාණ්ඩු පාලන ක්‍රමවල දක්නට ලැබුණු අත්‍යවශ්‍ය ලක්ෂණ වේ.

(5) මෙයින් ආණ්ඩු බලය සංවරණයන්ට ලක් නොකරයි. (.....)

10. ලිබරල්වාදය,

(1) මෙහි ප්‍රධානතම කාර්යවන්නේ දේපොළ පිළිබඳ පොදු සමාජීය අයිතිය ඇති කිරීමයි.

(2) යටත් විජිත රාජ්‍ය වල වර්ධනය වූ මතවාදයකි.

(3) මෙය 19 වන සියවසේ සමාජවාදයට එරෙහිව ආරම්භ විය.

(4) ධනවාදී ආර්ථික ක්‍රමය මත පදනම් වී ඇත.

(5) කාල්මාක්ස්, ෆෙඩ්රික් ඒංගල්ස් මෙහි ආරම්භකයෝ වෙති. (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

11. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) තුලනාත්මක ප්‍රවේශයේ දී ප්‍රතිමානීය අරමුණ ගැන උනන්දුවක් දක්වයි.
    (2) චර්යාවාදී ප්‍රවේශය ආනුභවික පර්යේෂණ මත නිගමන වලට එළඹේ.
    (3) අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ කාල්මාක්ස් සාම්ප්‍රදායික වටහා ගැනීම වෙනස් කළේය.
    (4) සමාජ විද්‍යාත්මක ප්‍රවේශය න්‍යායන්, විධික්‍රමයන් දේශපාලන විද්‍යාවට ද යොදා ගැනේ.
    (5) ස්ත්‍රීවාදී ප්‍රවේශය මඟින් දේශපාලන විග්‍රහයේ දී මතු කරන සාම්ප්‍රදායික ප්‍රශ්න වෙනස් කළේය.
    (.....)

12. ඇමරිකානු එක්සත් ජනපද ආණ්ඩුක්‍රම මාදිලිය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
    (1) ප්‍රාන්ත ඒකක වලට හැඟවුම්ගත බලතල ලබා දී ඇත.
    (2) ඇමරිකානු ව්‍යවස්ථාව මඟින් යුද්ධය සම්බන්ධ බලතල මධ්‍යම ආණ්ඩුවට ලබා දී ඇත.
    (3) සෑම ප්‍රාන්තයකටම සමාන බලතල ලබා දී ඇත.
    (4) සම්භාව්‍ය සන්ධිය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ දක්නට ලැබේ.
    (5) ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වේ. (.....)

13. ප්‍රංශ ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) නූතන ලෝකයේ බිහි වූ ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව වේ.
    (2) අතිශයින්ම බලය කේන්ද්‍රගත ඒකීය රාජ්‍යයකි.
    (3) මෙහි උපජාතික ආණ්ඩු තල 3 ක් යටතේ සංවිධානය වී තිබේ.
    (4) දේශපාලන බලය විමධ්‍යගතකරණය ප්‍රංශයේ දක්නට නැත.
    (5) මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක වේ. (.....)

14. කේඩර පක්ෂවල ලක්ෂණයක් නොවන්නේ,
    (1) මැතිවරණ කාලවල දී පමණක් ක්‍රියාත්මක වන මෙවා "මැතිවරණ යාන්ත්‍රණයන්" ලෙස සැලකේ.
    (2) ප්‍රබල සංවිධාන ව්‍යූහයක් ක්‍රියාත්මක වේ.
    (3) විශේෂයෙන් නායකත්වය මත රඳා පවතී.
    (4) පක්ෂවල ප්‍රබල ප්‍රතිපත්තිමය වෙනසක් දක්නට ලැබේ.
    (5) ඇමරිකාව මේ සඳහා දිය හැකි හොඳම නිදසුන වේ. (.....)

15. නව ලිබරල් රාජ්‍ය ක්‍රමය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
    (1) රාජ්‍ය මුළුමනින්ම ආර්ථික කටයුතු සඳහා මැදිහත් වේ.
    (2) සුබ සාධක සංකල්පයට පසු බිහි විය.
    (3) ධනවාදී වෙළඳපොළ ආර්ථිකයට අවශ්‍ය වටපිටාව සම්පාදනය කරයි.
    (4) රාජ්‍ය නිර්බාදවාදය හා සුබ සාධක රාජ්‍ය ක්‍රමයට අතරමැදි තත්වයක් වේ.
    (5) රාජ්‍ය ආර්ථික කළමනාකරුවා ලෙස ක්‍රියා කෙරේ. (.....)

16. දේශපාලන විද්‍යාවේ උප ක්ෂේත්‍රයකට අදාළ නොවන්නේ,
    (1) තුලනාත්මක දේශපාලනය
    (2) දේශපාලන ආයතන
    (3) ගැටුම් කළමනාකරණය
    (4) දේශපාලන න්‍යාය
    (5) කාර්යාල කළමනාකරණය (.....)

17. ඒකතාන්ත්‍රික ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
(1) පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත වේ.
(2) පරම රාජාණ්ඩු ක්‍රමය හා ඒකාධිපතිවාදයේ ඓතිහාසික ස්වරූපය වේ.
(3) නෛතික අවරෝධක මඟින් ඒකාතාන්ත්‍රිකයාගේ තීරණ අවරෝධක කරයි.
(4) නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය මාදිලියකි.
(5) දේශපාලන විවිධත්වයට ඉඩ සපයයි. (.....)

18. ජාතිකවාදයට නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) ක්‍රමානුකූල ඒකාග්‍ර චින්තනයක් නැත.
(2) ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකිය.
(3) විවිධ සමාජ වලින් බිහි වී ඇති ජාතිකවාදී මතවාදවල ව්‍යුහාත්මක අසමානතා තිබේ.
(4) ස්වයං තීරණ අයිතිය සමඟ බැඳේ.
(5) අත්‍යන්ත සහිත ජාතිවාදය ප්‍රචණ්ඩත්වය සඳහා පෙළඹේ. (.....)

19. සහමන්ත්‍රණය යන සංකල්පයට නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) සාකච්ඡාමය ක්‍රියාවලියක් වේ.
(2) ගැටුම් අතරතුර සාමදාන විසඳුමකට උත්සාහ කරයි.
(3) මෙහිදී ගැටුම සම්බන්ධයෙන් පොදු ස්ථාවරයකට පැමිණිය හැක.
(4) සහමන්ත්‍රණය සිදු කරන ආකාරය දෙකකි.
(5) විසඳුමක් සොයා ගැනීමට තම අරමුණ හා අපේක්ෂා නම්‍යශීලි කර ගනී. (.....)

20. විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටළුවක් නොවන්නේ,
(1) භෞමික වශයෙන් කුමන කුඩා රාජ්‍යයක් වීම.
(2) කලාපීය බලතුලනය
(3) ආර්ථික හා භෞතික ශක්තීන් බහුල වීම.
(4) ජාත්‍යන්තර බල තුලනය
(5) සමාජ දේශපාලන දෘෂ්ටින් හා කතිකාවන් (.....)

- අංක **21** සිට **25** දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

21. 1833 කෝල්බෘක් කැමරන් කොමිසම විසින් නිර්දේශ කරන ලද යෝජනා වල ප්‍රතිඵලයක් වන්නේ,
(A) වාණිජ වතු වගාව ව්‍යාප්ත වීම.
(B) ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තියක් බිහි වීම.
(C) අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍ය වර්ධනය වීම.
(D) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලබීජය රෝපණය වීම.
(E) දේශීය කෘෂි ආර්ථිකය සැලකිය යුතු ලෙස වර්ධනය වීම.

(1) A B C D (2) A B C E (3) A B D E
(4) A C D E (5) B C D E (.....)

22. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයට අදාළ වන්නේ,
(A) වගකීමේ ආණ්ඩු ක්‍රමයට අවශ්‍ය පසුබිම නිර්මාණය වීම.
(B) වාර්ගික නියෝජනය ඇති කිරීම මඟින් ජාතීන් අතර සමගිය වර්ධනය වීම.
(C) දේශපාලන පක්ෂ ක්‍රමයක් බිහි වීම.
(D) අනාගත දේශපාලන නායකයින් බිහි වීමට පදනම වැටීම.
(E) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු පුරුදු වීම.

(1) A B C D (2) A B C E (3) A B D E
(4) A C D E (5) B C D E (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

23. 1833 – 1924 දක්වා හඳුන්වා දුන් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ වලට අදාළ වන්නේ,

(A) 1833 දී වාර්ගික නියෝජනය හඳුන්වා දෙන ලදි.

(B) 1910 වාර්ගික නියෝජනයෙන් සිංහලයන් වෙනුවෙන් තිදෙනෙක් පත් කරන ලදි.

(C) 1920 මැනිං ආණ්ඩු ක්‍රමය තුළින් ප්‍රථම වරට නිල නොලත් සභිකයන් වැඩි කරන ලදි.

(D) 1920 ප්‍රථම වරට ප්‍රාදේශීය නියෝජනයෙන් මන්ත්‍රීවරු තෝරා ගැනීම ආරම්භ කරන ලදි.

(E) 1924 ප්‍රථම වරට සීමිත ඡන්දයෙන් තෝරා ගත් පිරිස වැඩි විය.

(1) A B C D (2) A B C E (3) A B D E

(4) A C D E (5) B C D E (.....)

24. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ නියෝජිතයන් තෝරා ගත් මැතිවරණයේ ලක්ෂණයක් වන්නේ,

(A) සහපේක්ෂ බහුතරය ලැබූ අපේක්ෂකයා මන්ත්‍රීවරයා විය.

(B) ජනතාවට තම කැමැත්ත ඍජුව ප්‍රකාශ කළ හැකිය.

(C) පුරප්පාඩු වූ මන්ත්‍රීධුරයක් සඳහා ලැයිස්තුව තුළින් තෝරා ගනී.

(D) බහුමන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රියාත්මක විය.

(E) මන්ත්‍රීවරයා හා ඡන්දදායකයා අතර සමීප සබඳතා තිබේ.

(1) A B C D (2) A B C E (3) A B D E

(4) A C D E (5) B C D E (.....)

25. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මඟින් ඇති කළ නවාංග වන්නේ,

(A) රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.

(B) මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයකින් යුක්ත වීම.

(C) රාජ්‍ය පාලනයේ දී ගුරු කොටගන්නා රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්මය.

(D) කැබිනට් මණ්ඩල සාමූහික වගකීම.

(E) නීති සම්පාදනයේ උත්තරීතරත්වය සහිත ජාතික රාජ්‍ය සභාව.

(1) A B C D (2) A B C E (3) A B D E

(4) A C D E (5) B C D E (.....)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

අංකය	පළමුවැනි ප්‍රකාශය	දෙවෙනි ප්‍රකාශය
(1)	සත්‍ය	සත්‍ය
(2)	සත්‍ය	අසත්‍ය
(3)	අසත්‍ය	සත්‍ය
(4)	අසත්‍ය	අසත්‍ය
(5)	සත්‍ය	සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි.

	පළමුවැනි ප්‍රකාශය	දෙවෙනි ප්‍රකාශය
26.	1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය මඟින් ප්‍රථම වතාවට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ව්‍යවස්ථාව ඇතුළත් කරන ලදි.	මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කරන යාන්ත්‍රණයක් ව්‍යවස්ථාවට ඇතුළත් කොට නොතිබීම ප්‍රබල දුර්වලතාවක් වේ. (.....)

27.	1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා මහජන ඡන්දයෙන් වසර 06 කට තෝරා ගනී.	19 වන සංශෝධනය මඟින් ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 5 සිට 6 දක්වා වැඩි කරන ලදි. (.....)
28.	20 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයෙකුට පවා ජනාධිපති ධූරයට තරඟ කළ හැකිය.	මෙම සංශෝධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ස්ථාපිත කරන ලදි. (.....)
29.	ශ්‍රී ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය ශ්‍රී ලංකා සම සමාජ පක්ෂය වේ.	සම සමාජ පක්ෂය ප්‍රමුඛ වාමාංශික පක්ෂ පසුකාලීනව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සහාග දේශපාලනයට පිවිසීම පසුකාලීනව සිදු විය. (.....)
30.	ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය වීමට පාලන තන්ත්‍රයේ දේශපාලන දෘෂ්ඨීන් බලපෑම් නොකරයි.	කලාපීය හා ජාත්‍යන්තර දේශපාලනයේ ස්වරූපය මත ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය වෙනස් නොකරයි. (.....)

B කොටස

31. ගෝලීයකරණය ජාතික රාජ්‍යයට බලපෑම් කළේ කෙසේද යන්න පිළිබඳව බිහි වූ න්‍යායික ප්‍රවේශ දෙක ලියන්න.
    (1) .....
    (2) .....

32. තුලනාත්මක දේශපාලනය හැදෑරීමට දේශපාලන විද්‍යාඥයින් උනන්දු වීමට හේතු දෙකක් ලියන්න.
    (1) .....
    (2) .....

33. දේශපාලන විද්‍යාවේ න්‍යාය යන සංකල්පයට අර්ථ දෙකක් තිබේ. ඒවා ලියන්න.
    (1) .....
    (2) .....

34. අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයට 19 වන සියවසේ නව ප්‍රවේශයක් එක් කළේ කවුද? එම ප්‍රවේශය කුමක් ද?
    (1) .....
    (2) .....

35. නූතන භෞමික රාජ්‍යයක ලක්ෂණ දෙකක් ලියන්න.
    (1) .....
    (2) .....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

36. වර්තමානයේ රාජ්‍ය හා පුරවැසියා අතර සබඳතාවයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් තිබේ. ඒ මොනවාද?

(1) .....

(2) .....

37. රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය ස්ථානගත වීම අනුව ගොඩනැඟී ඇති ආණ්ඩු ක්‍රම ආකෘති 2 ක් ලියන්න.

(1) .....

(2) .....

38. පහත සඳහන් කෘතිවල කතුවරුන් ලියන්න.

(1) කොමියුනිස්ට් ප්‍රකාශනය - .....

(2) ඉතිහාසයේ අවසානය හා අන්තිම මිනිසා - .....

39. අන්තර්ජාතික දේශපාලනයේ රාජ්‍ය නොවන ක්‍රියාධරයින් දෙදෙනෙක් ලියන්න.

(1) .....

(2) .....

40. ලංකාවේ දැනට පවතින පැරණිතම වාමාංශික පක්ෂ දෙක ලියන්න.

(1) .....

(2) .....

41. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම සඳහා පිහිටුවා ඇති යාන්ත්‍රණයන් දෙකක් ලියන්න.

(1) .....

(2) .....

42. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අපේක්ෂා කළ අරමුණු දෙකක් ලියන්න.

(1) .....

(2) .....

43. රාජ්‍ය ප්‍රතිපත්ති හා බැඳුණු සංකල්ප දෙකක් ලියන්න.

(1) .....

(2) .....

44. සුළු ජාතික රැකවරණ සඳහා සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ ඇති කළ විධි විධාන 2 ක් ලියන්න.

(1) .....

(2) .....

45. සන්ධිය ආණ්ඩු පිහිටුවා ගැනීමට මුල්වන හේතු 2 ක් ලියන්න.

(1) .....

(2) .....

46. 1947 ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටුවා ඇති අගමැතිවරයා යටතේ තබා ගත යුතු අමාත්‍යාංශ දෙක ලියන්න.

(1) .....

(2) .....

47. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඇති කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය වෙත යොමු කරන පනත් කෙටුම්පත් වර්ග දෙක සහ ඒවාට තීරණ ලබා දෙන කාලසීමාවන් ලියන්න.

(1) .....

(2) .....

48. 18 වන සංශෝධනය මඟින් ඇති කළ වෙනස්කම් 2 ක් ලියන්න.

(1) .....

(2) .....

49. 1978 ආණ්ඩු ක්‍රමය මඟින් පාර්ලිමේන්තුවට මන්ත්‍රීන් තෝරා ගැනීමේ දී ඡන්දයෙන් තෝරා ගන්නා මන්ත්‍රීවරුන් ආකාර දෙකකට තෝරා ගනී. එම ආකාර දෙක හා සංඛ්‍යාව ලියන්න.

(1) .....

(2) .....

50. ගැටුම් වල කාර්යය අනුව ප්‍රවේශ දෙකකි. ඒ මොනවාද?

(1) .....

(2) .....

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025

General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	23	S	II	දේශපාලන විද්‍යාව / Political Science	II / II	කාලය : පැය තුනයි / Time : Three hours

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.
- I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද,
  II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද,
  III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන
  ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

(1). ඔබ දේශපාලනය හඳුනා ගන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 20)

(2). පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් විස්තර කරන්න.

(I) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ලක්ෂණ

(II) ෆැසිස්ට්වාදී රාජ්‍යයක ලක්ෂණ

(III) සමාජවාදී රාජ්‍යය

(ලකුණු 10 x 2 = 20)

(3). පහත සඳහන් මාතෘකා වලින් දෙකක් පැහැදිලි කරන්න.

(I) විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය

(II) පාර්ලිමේන්තු සහ ජනාධිපති ආණ්ඩු ක්‍රමය සංසන්දනය

(III) බලපෑම් කණ්ඩායම්

(IV) දේශපාලන පක්ෂ වර්ගීකරණය

(ලකුණු 10 x 2 = 20)

II කොටස

(4). 1833 කෝල්බෘක් කැමරන් ආණ්ඩුක්‍රමය මඟින් ඇති කළ ප්‍රතිසංස්කරණ මඟින් සිදු වූ සමාජ හා දේශපාලන ප්‍රතිඵල විමසන්න. (ලකුණු 20)

(5). ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ වාසි අවාසි පැහැදිලි කරන්න. (ලකුණු 20)

(6). 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය හා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය ආශ්‍රයෙන් පහත මාතෘකා සංසන්දනය කරන්න.

(I) නාමික විධායකය

(II) ව්‍යවස්ථාදායකය

(III) රාජ්‍ය සේවය

(ලකුණු 10 x 2 = 20)

(7). පහත මාතෘකා වලින් දෙකක් පැහැදිලි කරන්න.

(I) 1978 ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාදායක බලතල

(II) ජනමත විචාරණය

(III) ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල හා කාර්යයන්

(IV) 20 වන සංශෝධනය

(ලකුණු 10 x 2 = 20)

III කොටස

(8). පහත සඳහන් මාතෘකා වලින් එකක් පැහැදිලි කරන්න.

(I) "බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය අර්ධ සන්ධිය වේ." පැහැදිලි කරන්න.

(II) ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 20)

(9). ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධරයන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

(10).පහත සඳහන් ඕනෑම මාතෘකා වලින් දෙකක් පැහැදිලි කරන්න.

(i) ගැටුම් ජීවන චක්‍රය

(ii) බලතල බෙදීම

(iii) ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක

(iv) ස්ත්‍රීවාදය

(v) අර්ධ සන්ධිය ආණ්ඩු ක්‍රමය

(vi) සමාජ සම්මුතිවාදය

(ලකුණු 10 x 2 = 20)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



උඟව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	23	දේශපාලන විද්‍යාව Political Science	

පිළිතුරු පත්‍රය

A කොටස

(1) 1	(11) 1	(21) 1
(2) 3	(12) 1	(22) 4
(3) 2	(13) 4	(23) 4
(4) 3	(14) 4	(24) 3
(5) 5	(15) 1	(25) 2
(6) 1	(16) 5	(26) 1
(7) 2	(17) 2	(27) 2
(8) 3	(18) 3	(28) 2
(9) 2	(19) 4	(29) 5
(10) 4	(20) 3	(30) 4

B කොටස

31. 1. ගෝලීයකරණය මඟින් ජාතික රාජ්‍යය අවසානයට පත් විය හැකි බව.
    2. ජාතික රාජ්‍යය අවසන් වන්නේ නැතිව, එය යලි ව්‍යූහගත කිරීමකට ලක් වන බව.

32. 1. අපේ රටේ දේශපාලනය ගැන වඩාත් හොඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.
    2. අනෙකුත් රටවල දේශපාලනය ගැන මනා අවබෝධයකට.
    3. දේශපාලන ගැටළු හා තේමා පිළිබඳ සාමාන්‍යකරණය කරන ලද පොදු නිගමනවලට එළඹීමට.

33. 1. ප්‍රතිමානීය න්‍යාය 2. විද්‍යාත්මක න්‍යාය

34. 1. කාල්මාක්ස් 2. ඓතිහාසික භෞතිකවාදය

35. 1. නිශ්චිත දේශසීමාව 2. ජාතික පදනම
    3. ආණ්ඩුව 4. ස්වාධිපත්‍ය

36. 1. පුරවැසියන් භුක්ති විඳින දේශපාලන අයිතිවාසිකම්
    2. පුරවැසියන්ගේ දේශපාලන වගකීම්

37. 1. ඒකීය ආණ්ඩු ක්‍රමය
    2. සන්ධීය ආණ්ඩු ක්‍රමය
    3. අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමය

4. සහ සන්ධිය ආණ්ඩු ක්‍රමය

38. 1. කාල්මාක්ස් සහ ෆෙඩ්රික් ඒංගල්ස්
2. ෆ්‍රැන්සිස් ෆුකුයාමා

39. 1. බහුජාතික සමාගම්
2. රාජ්‍ය නොවන සංවිධාන
3. කීර්තිමත් පුද්ගලයන්
4. ත්‍රස්තවාදී කණ්ඩායම්

40. 1. ලංකා සම සමාජ පක්ෂය
2. ලංකා කොමියුන්ස්ට් පක්ෂය

41. 1. ශ්‍රේෂ්ඨාධිකරණය
2. ඔම්බුඩ්ස්මන්වරයා
3. මානව හිමිකම් කොමිසම

42. 1. සමාන භාෂා අයිතිවාසිකම් තහවුරු කිරීමට
2. පුළුල් බලය බෙදා හැරීමක්

43. 1. ප්‍රතිපත්ති උපදේශනය 2. ප්‍රතිපත්ති නායකත්වය 3. ප්‍රතිපත්ති විශ්ලේෂණය

44. 1. 29 වන වගන්තිය
2. අධිකරණ විවරණ බලය
3. බහුමන්ත්‍රී කොට්ඨාශ ඇති කිරීම.

45. 1. භූගෝලීය විශාලත්වය
2. සංස්කෘතියක විවිධත්වය
3. බාහිර තර්ජනයක පැවැත්ම

46. 1. ආරක්ෂක අමාත්‍යාංශය
2. විදේශ කටයුතු අමාත්‍යාංශය

47. 1. සාමාන්‍ය පනත් - දින 14
2. ජාතියේ හිත සුව පිණිස විශේෂ පනත් - පැය 24

48. 1. ජනාධිපතිවරයාගේ දෙවනාවේ ධුරකාලය ඉවත් කිරීම.
2. මාස 3 ට වරක් පාර්ලිමේන්තුවට පැමිණීම.
3. ස්වාධීන කොමිෂන් සභා

49. 1. ජනගහන මූලධර්මයෙන් 160
2. පළාත් මූලධර්මයෙන් 36

50. 1. සාධනීය පැතිකඩ
2. නිශේධනීය පැතිකඩ


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!